# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1767 - 2012 ජූලි 13 වැනි සිකුරාදා - 2012.07.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | -- |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1186 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 1188 |

| | පිටුව |
|---|---|
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | -- |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 අගෝස්තු මස 03 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 ජූලි මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2012 ජූනි මස 23 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# පළාත් පාලන නිවේදන

**පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව, රඹුක්පිටිය**

මහනුවර දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කෞදර්ස්ලෑන්ඩ් නිවාස ව්‍යාපෘතිය, සිල්වාස්ලෑන්ඩ් නිවාස ව්‍යාපෘතිය පිහිටි ප්‍රදේශ දියුණු ප්‍රදේශයක් ලෙස නම් කිරීම

මහනුවර දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි කෞදර්ස්ලෑන්ඩ් නිවාස ව්‍යාපෘතිය, සිල්වාස්ලෑන්ඩ් නිවාස ව්‍යාපෘතියේ ප්‍රදේශ මෙහි පහත උපලේඛනයේ සඳහන් පරිදි මායිම් තුළ ඇති සියලුම ප්‍රදේශ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 134(1) යන වගන්ති ප්‍රකාරයෙන් දියුණු ප්‍රදේශයක් ලෙස මහනුවර පළාත් පාලන සහකාර කොමසාරිස්තුමියගේ අනුමැතිය පරිදි මහජනයාට දැනගැනීම පිණිස ප්‍රසිද්ධ කරනු ලැබේ.

ඕ. ජී. රෝහණ බණ්ඩාර,
සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2012 ජුනි මස 21 වැනි දින,
රඹුක්පිටිය,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

*පිඹුරු අංක ඒ 3130*
*සිල්වාස්ලෑන්ඩ් නිවාස ව්‍යාපෘතිය*

*උතුර* - හෙට්ටියාවත්ත - එච්. එල්. ඩී. එච්. සොයිසා සහ අනිත් අය, හල්ඔය අමුණ, බෝපිටිය කුඹුර, සී. එල්. එම්. මරික්කාර් සහ ප්‍රධාන මාර්ගය

*නැගෙනහිර* - අන්ධගහමුලහේන, ඒ. පී. රණතුංග මහත්මියගේ බෙරක අංග කුඹුර, කේ. පී. කිරිබයිස් හා උඩහලියමේ කුඹුර, ඕ. එල්. එම්. ලෙබ්බේ යන අනිත් අය

*දකුණ* - මහවැලි ගඟ

*බටහිර* - කෞදර්ස්ලෑන්ඩ් කුඹුර පී. සුප්පුසාමි සහ අනිත් අය උඩ රඹුක්පිටිය ගමේ කෞදර්ස්ලෑන්ඩ් තේ ඉඩම, පී සුප්පුසාමි සහ අනිත් අය, හෙට්ටියාවත්ත එච්. එල්. ඩී. එච්. සොයිසා සහ අනිත් අය.

පිඹුරු අංක 5663 ඒ
කෞදර්ස්ලෑන්ඩ් නිවාස ව්‍යාපෘතිය

*උතුර* - කේ. එස්. සුමිත්‍රාගේ ඉඩම හා ප්‍රධාන මාර්ගය,

*නැගෙනහිර* - ඩබ්. ඩී. කිරිබණ්ඩා මහතාගේ කොළණියේ ඉඩම, එන්. ඩබ්. ධර්මපාල මහතාගේ ඉඩම හා ප්‍රාදේශීය සභාවේ පාර,

*දකුණ* - ඊ. කැකිරිගොඩගේ හා අනිත් අයගේ ඉඩම සහ පාර,

*බටහිර* - කේ. ඒ. අමරසේනගේ ඉඩම හා පාර, එම්. කේ. බී. හේරත්ගේ ඉඩම හා පී. ජී. පුංචිරාළගේ ඉඩම.

07-267

---

**සේරුවිල ප්‍රාදේශීය සභාව**

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත යටතේ නිවේදනය

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ උතුරු නැගෙනහිර පළාත් සභාව විසින් බලය පවරනු ලදුව සේරුවිල ප්‍රාදේශීය සභාව විසින් සම්මත කරන ලද යෝජනාව මෙයින් පළ කරනු ලැබේ.

**යෝජනාව**

පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ, 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි, 126 වැනි, හා 221 (අ) වැනි වගන්ති යටතේ බලය පවරන ලද විධිවිධානවලට අනුව,1988 අගෝස්තු මස 23 වැනි දින අංක 520/7 දරන අති විශෙෂ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පළාත් පාලන ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූ ද, උතුරු නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරයා විසින් යෝජනා කරන ලද, උතුරු නැගෙනහිර පළාතේ පළාත් සභාවට අදාළ වන්නක් බවට සම්මත කරන ලද්දාවූ 1994 ඔක්තෝබර් මස 21 වැනි දින අංක 842 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV වැනි කොටසේ පළ කරන ලද්දාවූ, අතුරු ව්‍යවස්ථාවල II වැනි කොටසේ අංක 01 සිට 42 දක්වා වූ කොටස්, මේ යෝජනාව *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික, සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ වන දින සිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට ඒකමතිකව තීරණය කරන ලදී.

ඩබ්ලිව්. එම්. එන්. පී. විජේසිංහ,
සභාපති,
සේරුවිල ප්‍රාදේශීය සභාව.

2012ක් වූ ජුනි මස 05 වැනි දින,
සේරුනුවර,
සේරුවිල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

07-299

---

**ගෝ ඝාතක ආඥාපනත (272 වැනි අධිකාරය)**

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් ඒ අයගේ නම ඉදිරියෙන් සඳහන් ගෝඝාතකාගාරයේ මස් පිණිස සතුන් ඝාතනය කිරීමටත් නම ඉදිරියෙන් සඳහන් මස් වෙළෙඳසැලෙහි මස් වෙළඳාම් කිරීමටත් 2012 වර්ෂය සඳහා බලපත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බවත් ගෝඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම බලපත්‍රය නිකුත් කිරීම සඳහා විරෝධතාවක් දැක්වීමට අදහස් කරන උඩුනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම අයෙකුට ඔහුගේ /ඇයගේ විරෝධතාව සඳහා හේතුව දක්වමින් පිටපත් දෙකකින් යුතු ලියවිල්ලක් මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළවන දින සිට දින 14ක් ඇතුළත මා වෙත එවන ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

ආර්. එම්. බන්දුල සෙනෙවිරත්න,
සභාපති,
උඩුනුවර ප්‍රාදේශීය සභාව.

2012 ජුනි මස 18 වැනි දින,
ගෙලිඔය පිහිටි,
උඩුනුවර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *අනු. අංකය* | *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *මස් වෙළෙඳසල පිහිටි ස්ථානය* | *ගෝඝාතකාගාරය පිහිටි ස්ථානය* |
|---|---|---|---|
| 01 | මුයිනුද්න් මොහොමඩ් ඉක්බාල් මහතා අංක 157, පැනිදෙණිය, පේරාදෙණිය. | අංක 135, දවුලගල, හන්දෙස්ස | 195/1, මාහිංගොඩ, හන්දෙස්ස |

07-297

# අතුරු ව්‍යවස්ථා

**දැරණියගල ප්‍රාදේශීය සභාව**

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 වගන්තිවලින් ලැබී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාත් සභා පරිපාලන බල ප්‍රදේශයේ දැරණියගල ප්‍රාදේශීය සභාව විසින් සම්මත කර ඇති පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව, ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සබරගමුව පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මහීපාල හේරත්,
පළාත් පාලන විෂයභාර අමාත්‍ය,
සබරගමුව පළාත.

2012ක් වූ ජුනි මස 11 වැනි දින.

**දැරණියගල ප්‍රාදේශීය සභාව සතු මංමාවත් භාවිතය පාලනය කිරීමේ හා විධිමත් කිරීමේ අතුරු ව්‍යවස්ථාව**

01. මෙම අතුරු ව්‍යවස්ථාව දැරණියගල ප්‍රාදේශීය සභාව සතු මංමාවත්වල වාහන ගමනාගමනය පාලනය කිරීමේ හා විධිමත් කිරීමේ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

02. දැරණියගල ප්‍රාදේශීය සභාවේ ප්‍රාදේශීය සභා මාර්ග යනුවෙන් ප්‍රකාශයට පත් කොට ඇති හා වෙනත් අධිකාරියකට අයත් නොවන්නා වූ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ගවල බර වාහන ගමනාගමනය විධිමත් කිරීම, පාලනය කිරීම, මාර්ගවලට වන හානිය අවම කිරීම මෙම අතුරු ව්‍යවස්ථාව පැණවීමේ අරමුණ වේ.

03. මෙම අතුරු ව්‍යවස්ථාව ගැසට් පත්‍රයේ පළ වූ දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

04. (i) මින් මතු ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් නිකුත් කරන ලද පළමු උපලේඛනයේ දැක්වෙන ගාස්තු ගෙවා ලබා ගන්නා ලද අවසර පත්‍රයක් දරන්නේ නම් මිස ඉහත දෙවැනි අතුරු ව්‍යවස්ථාවෙන් අර්ථ දැක්වෙන මාර්ගයක බර ටොන් 02කට වඩා වැඩි වන්නා වූ ටිපර් රථයක්, ට්‍රැක්ටරයක්, මාර්ග ඉදිකිරීමේ යන්ත්‍රයක් ධාවනය කිරීම හෝ ගල්, වැලි ආදී සියලුම ගොඩනැගිලි ද්‍රව්‍ය හෝ වෙනත් ඛනිජ හෝ රබර් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවාහනය කිරීම හෝ නොකළ යුතු ය.

(ii) මෙම මාර්ගයක් මතින් සතුන් ලවා හෝ ට්‍රැක්ටරයක් මගින් දැව කඳන් හෝ වෙනත් ද්‍රව්‍ය ඇද්දවීම හෝ ඇදගෙන යාම නොකළ යුතු ය.

(iii) වායු පීඩන ටයර් රහිත කිසිදු වාහනයක් වෙනත් වාහනයක පටවා මිස ප්‍රාදේශීය සභාවට අයත් කිසිදු මාර්ගයක ධාවනය කිරීම නොකළ යුතු ය.

05. (i) කිසියම් පුද්ගලයෙකු මෙම අතුරු ව්‍යවස්ථාවේ අර්ථ නිරූපනය වන මාර්ගයකින් කිසියම් ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍යයක්, කෘෂිකාර්මික නිෂ්පාදනයක්, දැව හෝ යන්ත්‍රෝපකරණ ප්‍රවාහනය කරන්නේ නම් ඒ සඳහා පළමුවැනි උපලේඛනයේ සඳහන් මුදල් සභාවට ගෙවා සභාපතිවරයාගේ අවසරයකින් තොරව ප්‍රවාහනය නොකළ යුතු ය.

(ii) කිසියම් පුද්ගලයෙකු මෙම අතුරු ව්‍යවස්ථාවේ දෙවන ව්‍යවස්ථාවෙන් නිරූපනය වන මාර්ගයකින් කිසියම් ගොඩනැගිලි ද්‍රව්‍යයක්, කෘෂිකර්ම නිෂ්පාදනයක්, දැව හෝ යන්ත්‍රෝපකරණ ප්‍රවාහනය කරන්නේ නම් ඒ සඳහා ලිඛිත ඉල්ලීමක් සභාවේ සභාපතිවරයා වෙත යටත් පිරිසෙයින් දින 03කට වරක් වත් ඉදිරිපත් කළ යුතු ය.

(iii) ඉහත 5 ፡ 11 වගන්තියේ පරිදි ඉල්ලීමක් ලැබුනු කල්හි සභාපතිවරයා විසින් කාර්මික නිලධාරී හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියෙකුගෙන් වාර්තාවක් කැඳවා ගාස්තු හා හානිවිය හැකි ප්‍රමාණයට ප්‍රමාණවත් වන ඇප තැන්පත් මුදලක් ලබා ගත යුතු ය.

(iv) ඉහත 5 ፡ 111 අනු ව්‍යවස්ථාව යටතේ ඇප මුදල් හා නියමිත ගාස්තු අයකිරීමෙන් පසුව ගිවිසුමකට එළඹීමෙන් අනතුරුව මිස අදාළ අවසරය ලබා නොදිය යුතු ය.

(v) ඉහත 5 ፡ IV අනු ව්‍යවස්ථාව යටතේ ලබා ගනු ලබන ඇප තැන්පත් මුදල නිදහස් කර දෙන ලෙස ඉල්ලීමක් ලද විට ප්‍රථමයෙන් 10% දෙපාර්තමේන්තු ගාස්තු ද අනතුරුව හානියක් වී ඇතොත් එකී අලාභය ද තක්සේරුකර ගත යුතු ය.

(vi) හානිය ඇප තැන්පත් මුදල ඉක්මවා යයි නම් එම අතිරේක මුදල ද ගෙවන ලෙස අදාළ පුද්ගලයන්ට නියම කිරීම නීත්‍යානුකූල වේ. එසේ ම හිඟ මුදල ගෙවන ලෙස නියම කළ අවස්ථාවක දී ගෙවීම් පැහැර හරින්නේ නම් නිසි අධිකරණ බලය සහිත අධිකරණයක නඩු පවරා හිඟ මුදල අයකර ගැනීමට ප්‍රාදේශීය සභාවට බලය ඇත්තේ ය.

(vii) ප්‍රාදේශීය සභාව සමග සංවර්ධන කටයුතුවලට අදාල ගිවිසුම්වලට එළඹී ඇති කොන්ත්‍රාත්කරුවන් විසින් සභාපතිවරයා වෙත කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මගින් මෙහි පළමු උපලේඛනයේ සඳහන් ගාස්තුවලින් නිදහස් කර ගත හැක.

06. සභාපතිවරයා හෝ ඔහු විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු නිකුත් කරනු ලබන විශේෂ අවසර පත්‍රයක් ඉල්ලුම්කරු පළමුවැනි උපලේඛනයේ සඳහන් මුදල සභාවට ගෙවා ලබාගත යුතු ය.

07. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම අවසර පත්‍රයක් ම පරීක්ෂා කිරීමේ බලය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ ඔහු විසින් බලය පවරන වෙනත් නිලධාරියෙකු විසින් ක්‍රියාත්මක කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

08. මෙම අතුරු ව්‍යවස්ථාවේ ඇතුළත් ඕනෑම වගන්තියක් උල්ලංඝනය කිරීම හෝ නොකර හැරීම වරදක් වන අතර කිසියම් තැනැත්තෙකු නිසි අධිකරණ බලය සහිත අධිකරණයකින් වරදකට වරදකරු කරනු ලැබූ විට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) වගන්තිය අනුව නියම කර ඇති දඩයකින් ද වරදක් කරනු ලැබීමෙන් පසු එම වරද දිගින් දිගටම කරනු ලබයි නම් එකී කඩකිරීම් කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ ඔවුන් විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු ද එකී වරද කරගෙන යනු ලබන සෑම දිනයක් සඳහා ම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) වැනි වගන්තිය අනුව නියම කර ඇති අතිරේක දඩයකට යටත් විය යුතු ය.

09. මෙම අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන යම් ගැටළුවක දී සභාපතිවරයාගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

10. මෙම අතුරු ව්‍යවස්ථාවේ පළමුවැනි උපලේඛනයේ සඳහන් ගාස්තු වරින් වර සංශෝධනය කිරීමේ බලය දැරණියගල ප්‍රාදේශීය සභාව සතු වන්නේ ය.

11. මෙම අතුරු ව්‍යවස්ථාවේ කිසියම් ව්‍යවස්ථාවක අර්ථය සම්බන්ධයෙන් අනනුකූලතාවයක් ඇතිවුවහොත් මෙහි සිංහල පිටපත සෑම අවස්ථාවකම බලාත්මක විය යුතු ය.

12. මෙම අතුරු ව්‍යවස්ථාවේ කටයුතු සඳහා -

"ප්‍රාදේශීය සභාව" යන්නෙන් දැරණියගල ප්‍රාදේශීය සභාව ද,

"සභාපතිවරයා" යන්නෙන් දැරණියගල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

"ලේකම්" යන්නෙන්, දැරණියගල ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා ද,

"බලය පවරන ලද නිලධාරී " යන්නෙන් සභාපතිවරයා විසින් බලය පවරන ලද දැරණියගල ප්‍රාදේශීය සභාවේ නිලධාරියෙකු ද, ග්‍රාම නිලධාරියෙකු ද, පොලිස් නිලධාරියෙකු ද
අදහස් වේ.

*පළමුවැනි උපලේඛනය*

| | | |
|---|---|---|
| | | *රු. ශ.* |
| 01. | වැලි හා පස් හා වෙනත් ඛණිජ ද්‍රව්‍ය ප්‍රවාහනය | |
| | කියුබ් 2ක් සඳහා | 100.00 |
| | කියුබ් 3ක් සඳහා | 150.00 |
| | කියුබ් 3ට වඩා වැඩිවන සෑම කියුබ් එකක් සඳහා ම | 50.00 බැගින් |
| 02. | දර, උණ දඬු ප්‍රවාහනය සඳහා එක් ගමන් වාරයකට | 500 00 |
| | දැව කඳන් ප්‍රවාහනය සඳහා එක් ගමන් වාරයකට | 1,000.00 |
| | ඉදිකිරීම් යන්ත්‍ර (චේන් ලොඩර් නොවන) ප්‍රවාහනය සඳහා එක් ගමන් වාරයකට | 1,500 0 |
| 03. | කෘෂිකාර්මික ද්‍රව්‍ය ප්‍රවාහනය | |
| | 1. නිතිපතා හෝ මසකට දින 05කට වැඩි | 200.00 |
| | 2. නිතිපතා නොවන හෝ දින 05කට වැඩි නොවන | 100.00 |

07-433

---

**යටියන්තොට ප්‍රාදේශීය සභාව**

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 වගන්තිවලින් ලැබී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාත් සභා පරිපාලන බල ප්‍රදේශයේ යටියන්තොට ප්‍රාදේශීය සභාව විසින් සම්මත කර ඇති පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව, ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සබරගමුව පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මහීපාල හේරත්,
පළාත් පාලන විෂයභාර අමාත්‍ය,
සබරගමුව පළාත.

2012 ජුනි මස 11 වැනි දින.

යටියන්තොට ප්‍රාදේශීය සභාව

*ආදාහනාගාරය පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව*

01. මෙම අතුරු ව්‍යවස්ථාව යටියන්තොට ප්‍රාදේශීය සභාවට අයත් හාමන්ද පොදු සුසාන භූමියේ පිහිටි ආදාහනාගාරයේ මෘත ශරීර ආදාහනය කිරීම, ගාස්තු නියම කිරීම, ගාස්තු අයකිරීම සහ ආදාහනාගාරයේ පාලනය විධිමත් කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. යටියන්තොට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් නොමැතිව සභාව සතු ආදාහනාගාරයේ කිසිදු මෘත ශරීරයක් ආදාහනය නොකළ යුතු යි.

03. මෙහි දෙවැනි ව්‍යවස්ථාවේ සඳහන් අවසර පත්‍රයක් ලබා ගැනීමට අපේක්ෂා කරන (මෙහි මින් මතු ඉල්ලුම්කරු යැයි සඳහන් කරනු ලබන) තැනැත්තෙකු විසින් මෙහි පළමුවැනි උපලේඛනයට අනුකූලව පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍රයක් පහත සඳහන් ලියවිලි සමග සභාපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය :-

(i) මියගිය තැනැත්තා පදිංචිව සිටි ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ග්‍රාම සේවා නිලධාරී විසින් නිකුත් කරන ලද සහතිකයක්

(ii) මියගිය තැනැත්තාගේ මරණය සම්බන්ධයෙන් අපරාධ නඩු විධිවිධාන සංග්‍රහ යටතේ පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම් පරීක්ෂණය පවත්වන ලද මරණ පරීක්ෂකවරයා විසින් උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 41 (ඉ) වගන්තිය යටතේ මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා අවසර දෙමින් නිකුත් කරන ලද සහතිකයක්

(iii) අජීවී උපතකින් බිහි කරන ලද මෘත ශරීරයක් නම් උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 43 (1) වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකය.

04. සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය සභාපතිවරයා වෙත භාර දෙනු ලැබීමෙන් පසු ලැබුණු අනුපිළිවෙල අනුව ලේඛනගත කළ යුතු ය.

05. මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා භාර ගනු ලබන්නේ නම් ඒ සඳහා නියමිත ගාස්තුව අයකර ගෙන අවසර පත්‍රය ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය යුතු ය. ආදාහනාගාර භාරකරු වෙත මෘත ශරීරය භාර දිය යුතු වේලාව අවසර පත්‍රයේ සඳහන් කළ යුතු වේ.

06. මෘත ශරීරය ආදාහනය සඳහා භාර ගනු නොලබන්නේ නම් ඒ බව එයට හේතු වූ කරුණු ද සමග ඉල්ලුම්කරුට ලිඛිතව දැන්විය යුතු ය.

07. සෑම දිනකම පෙ. ව. 6.00 සිට ප. ව. 8.00 දක්වා කාලය ඇතුළත ආදාහනය කිරීම සඳහා මෘත ශරීර භාරගනු ලැබේ.

08. ඉල්ලුම්කරු අවසර පත්‍රයේ සඳහන් කර ඇති වේලාවට හෝ එයට ප්‍රථම මෘත ශරීරය ආදාහනාගාර භාරකරු වෙත භාර දිය යුතු ය. ප්‍රමාද වී භාර දීම හේතුවෙන් ඇති වන අපහසුකම් හෝ අලාභ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව වග කියනු නොලැබේ.

09. සභාවේ සේවය කළ හෝ සේවය කරන යම් කිසි සභාපතිවරයෙකු, උපසභාපතිවරයෙකුගේ හෝ මන්ත්‍රීවරයෙකුගේ හෝ සභා නිලධාරියෙකුගේ හෝ සේවකයෙකුගේ මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා ගාස්තු අය කිරීමක් සිදු නොකළ යුතු ය.

10. ආදාහනාගාරයේ ආදාහනය කරන එක් එක් මෘත ශරීරය සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය මියගිය අයගේ නම හා ඔහු මිය යාමට ප්‍රථම පදිංචිව සිටි ස්ථානයේ ලිපිනය හා ඉල්ලුම්කරු මිය ගිය තැනැත්තා සමග තිබූ සම්බන්ධතාව ආදාහනය සිදු කරන ලද දිනය හා වේලාව ආදී විස්තර ආදාහනාගාර භාරකරු විසින් ලේඛනගත කළ යුතු ය.

11. මෘත ශරීර ආදාහනය කර දින 07ක් ගත වීමට ප්‍රථම ඉල්ලුම්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිත භෂ්මාවශේෂ භාර ගත යුතු වේ. නියමිත කාලය ඇතුළත භාර ගනු නොලබන භෂ්මාවශේෂ කවරාකාරයකට හෝ බැහැර කිරීමට සභාපතිවරයාට බලය ඇත.

12. ආදාහනාගාර භාරකරු හෝ සභාපතිවරයාගේ අවසරයක් නොමැතිව ආදාහනාගාර පරිශ්‍රයට ඇතුළුවීම නොකළ යුතු ය. එසේ වුව ද මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා අවසර පත්‍රලාභියෙකු සමග පැමිණෙන තැනැත්තෙකුට හෝ තැනැත්තියකට ඒ සඳහා අවසර දී ඇති ලෙස සලකනු ලැබේ.

13. මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා ආදාහනාගාරයට භාර දීමෙන් පසුව ආදාහනය කිරීම අතරමග හෝ ආදාහනය කිරීමට පෙරාතුව ආදාහනාගාරයේ යන්ත්‍රවල කාර්මික දෝෂයක් හෝ විදුලිය ඇනහිටීමක් මත මෘත ශරීරය ආදාහනය කිරීමට නොහැකි වුවහොත් එම මෘත ශරීරය භූමදානය කිරීමේ බලය සභාවේ සභාපතිවරයා සතු විය යුතු ය.

14. ආදාහනාගාර පරිශ්‍රය තුළ සාමය හා විනය කඩවන ආකාරයට හැසිරීම හෝ ආදාහනාගාර භාරකරු හෝ ඔහුගේ සහායකයින්ගේ රාජකාරි කටයුතුවලට බාධා කිරීම හෝ ආදාහනාගාර පරිශ්‍රය තුළ සැරසිලි කිරීම හෝ නොකළ යුතු අතර ආදාහනාගාර භූමිය තුළ ඇති සභාව සතු දේපළවලට හානියක් සිදු කරනු ලැබුවහොත් එම අලාභය බලයලත් සභා නිලධාරියකු ලවා තක්සේරු කර එම අලාභය අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

15. මෙම අතුරු ව්‍යවස්ථාවේ ඇතුළත් ඕනෑම ව්‍යවස්ථාවක් උල්ලංඝනය කිරීම හෝ නොකර හැරීමත් වරදක් වන අතර කිසියම් තැනැත්තෙක් නිසි අධිකරණ බලය සහිත අධිකරණයකින් වරදකට වරදකරු කරනු ලැබූ විට සහ එකී උල්ලංඝනය නොකඩවා කරගෙන යනු ලබන අවස්ථාවක 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත් 122 (2) උප වගන්තියෙන් නියම කර ඇති දණ්ඩනයට යටත් වන්නේ ය.

16. මෘත ශරීර ආදාහනය කිරීම සුදුසු තත්ත්වයකින් ආදාහනාගාරය නඩත්තු කර පවත්වාගෙන යාම ප්‍රාදේශීය සභාවේ කර්තව්‍යයක් වන අතර ආදාහනාගාර නඩත්තු කිරීම නව ප්‍රතිසංස්කරණ කිරීම සඳහා කිසියම් කාලයක් තුළ වසා තබනු ලබන්නේ නම් ඒ පිළිබඳ නිවේදනය ආදාහනාගාරයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක හා සභා කාර්යාලයේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීම සභාපතිවරයාගේ කර්තව්‍යයකි.

17. මෘත ශරීර ආදාහනය කිරීම සඳහා අයකර ගත යුතු ගාස්තු ප්‍රාදේශීය සභාවේ යෝජනා සම්මතයෙන් වාර්ෂිකව පනවනු ලැබිය හැකිය. එසේ පනවනු ලබන ගාස්තු ප්‍රාදේශීය සභාව අවශ්‍ය යැයි සලකනු ලබන අවස්ථා වලදී සංශෝධනය කළ හැකිය.

18. පද සම්බන්ධයෙන් අවශ්‍ය වුවහොත් මෙහි " සභාව" යන්නෙන් යටියන්තොට ප්‍රාදේශීය සභාව අදහස් වේ. "සභාපති" යන්නෙන් යටියන්තොට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ සභාපතිවරයාගේ බල තල කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ බලය පවරනු ලැබී ඇති තැනැත්තෙක් ද ඇතුළත් වේ. ආදාහනාගාර භාරකරු යන්නෙන් යටියන්තොට ප්‍රාදේශීය සභාව සතු ආදාහනාගාරයේ භාරකරු ලෙස කටයුතු කිරීම සඳහා පත් කර ඇති තැනැත්තෙකු අදහස් වේ. මෘත ශරීරය යන්නෙන් මනුෂ්‍යයෙකුගේ මෘත ශරීරය හෝ මෘත ශරීරයකින් කොටසක් හෝ සජීවී උපතකින් බිහි කරන ලද සිරුරක් ද ඇතුළත් වේ.

19. මෙම අතුරු ව්‍යවස්ථාවේ දෙමළ හා ඉංග්‍රීසි පිටපත්වල අර්ථය සම්බන්ධයෙන් නොගැලපීමක් ඇති වුවහොත් සිංහල පිටපත වලංගු වන්නේ ය.

*පළමු උපලේඛනය*

(පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතු ය)

යටියන්තොට ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයේ මෘත ශරීරයක් ආදාහනය කිරීමට අවසර පත්‍රයක් ලබා ගැනීමට ඉල්ලුම් කිරීම

01. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :————————.
ලිපිනය :————————.
ජාතික හැඳුනුම්පත් අංකය :————————.
ග්‍රාම නිලධාරි කොට්ඨාස අංකය හා නම :————————.
02. මියගිය අයගේ සම්පූර්ණ නම :————————.
ස්ත්‍රී පුරුෂ භාවය :————————.
පදිංචි වී සිටි ස්ථානයේ ලිපිනය :————————.
ග්‍රාම නිලධාරි කොට්ඨාස අංකය හා නම :————————.
03. මියගිය තැනැත්තාට ඉල්ලුම්කරුගේ ඇති සම්බන්ධතාවය :————————.
තහවුරු කිරීමට 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ (අ) ඡේදයේ සඳහන් සහතික අමුණන්න):————————.
04. මරණ සහතිකයේ ලියාපදිංචි අංකය හා දිනය :————————.
(මරණ සහතිකයේ පිටපත් අමුණන්න) :————————.
05. මරණ ලියාපදිංචි කිරීමේ ලේකම්ගේ නම හා කොට්ඨාසය :————————.
06. මරණයට හේතුව:————————.
07. මරණය සම්බන්ධයෙන් මරණ පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම් (3 වැනි අතුරු ව්‍යවස්ථාවේ (ආ) ඡේදයේ දැක්වෙන සහතික අමුණන්න)
08. මරණ සහතික නිකුත් කරන ලද පරීක්ෂණ නිලධාරියාගේ නම හා තරාතිරම:————————.
පරීක්ෂණය පැවැත්වූ දිනය:————————.
09. පරීක්ෂණ නිලධාරියාගේ නිගමනය:————————.
10. මෘත දේහය ආදාහනය කිරීමට පරීක්ෂණ නිලධාරියාගේ අවසරය දී තිබේ ද? :————————.
11. ආදාහනය කිරීමට ඉල්ලා සිටින දිනය හා වේලාව (කැමැත්ත අනුපිළිවෙල අනුව) :————————.

| | *දිනය* | *වේලාව* | | *දිනය* | *වේලාව* |
|---|---|---|---|---|---|
| 1. | 20 ................. | පැය .......................... | 2. | 20 ................. | පැය .......................... |
| 3. | 20 ................. | පැය .......................... | 4. | 20 ................. | පැය .......................... |

12. භෂ්මාවශේෂ බහාලීම සඳහා අදාළ පුද්ගලයාගේ නම සහ ලිපිනය සඳහන් බඳුනක් සපයා තිබීම/නොතිබීම.

ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

මෙහි දක්වා ඇති තොරතුරුවල සම්පූර්ණ වගකීම මා විසින් භාරගනු ලබන බව වැඩිදුරටත් දන්වා සිටිමි. අදාළ සහතිකය අමුණා ඇත.

————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————.

07-434

**අරණායක ප්‍රාදේශීය සභාව**

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 වගන්තිවලින් ලැබී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාත් සභා පරිපාලන බල ප්‍රදේශයේ අරනායක ප්‍රාදේශීය සභාව විසින් සම්මත කර ඇති පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව, ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මහීපාල හේරත්,
පළාත් පාලන විෂයභාර අමාත්‍ය,
සබරගමුව පළාත.

2012 ජුනි මස 11 වැනි දින.

**රථවාහන නවතා තැබීම, පාලනය කිරීම හා විධිමත් කිරීම සඳහා අතුරු ව්‍යවස්ථාව**

2010 ජනවාරි මස 22 වැනි දින අංක 1638 දරන *ගැසට් නිවේදනය* මගින් ප්‍රසිද්ධියට පත් කරන ලද අරණායක ප්‍රාදේශීය සභාවේ රථ වාහන නවතා තැබීම, පාලනය කිරීම හා විධිමත් කිරීම සඳහා වූ අතුරු ව්‍යවස්ථාවට පහත සඳහන් සංශෝධන මෙයින් එක් කෙරේ.

පහත සඳහන් ව්‍යවස්ථාව නව ව්‍යවස්ථාවක් ලෙස එක් කෙරේ.

(22) මෙම අතුරු ව්‍යවස්ථාවේ දෙමළ හා ඉංග්‍රීසි පිටපත් වල අර්ථ නිරූපනයේ දී යම් අපැහැදිලි තැනක් වුවහොත් සිංහල භාෂාවෙන් ඇති අතුරු ව්‍යවස්ථාව වලංගු වන්නේ ය.

උපලේඛන අංක 01 හි සිංහල පිටපත සඳහා පහත සඳහන් ස්ථානය එක් කෙරේ.

| *වාහන නතර කිරීමට නියමිත ස්ථානය* | *ත්‍රී විලර්* |
|---|---|
| කෙසෙල්වත්ත | පාසල් හන්දිය අසල |

උපලේඛන අංක 01 හි ඉංග්‍රීසි පිටපත සඳහා පහත සඳහන් ස්ථාන එක් කෙරේ.

| *වාහන නතර කිරීමට නියමිත ස්ථානය* | *ත්‍රීවීලර්* |
|---|---|
| අම්බලකන්ද | අම්බලකන්ද පාසල ඉදිරිපිට සහ බෝගහ අසල |
| දෙවනගල | දෙවනගල හන්දිය, දෙවනගල රජමහා විහාරයට යන හන්දිය |
| තෙල්ලෙක | තෙල්ලෙක සාමගම හන්දිය අසල |
| කාල්වාන | කාල්වාන බුදු මැදුර අසල |
| මිල්ලන්ගොඩ | මිල්ලන්ගොඩ බෝ ගහ අසල |
| මාලිගාතැන්න | මාලිගාතැන්න විද්‍යාලය අසල |
| කන්දේවත්ත | කන්දේවත්ත බුලුගහමුල අසල |

උපලේඛන අංක 01 හි දෙමළ පිටපත සඳහා පහත සඳහන් ස්ථාන එක් කෙරේ.

| *වාහන නතර කිරීමට නියමිත ස්ථානය* | *ත්‍රීවිලර්* |
|---|---|
| මිල්ලන්ගොඩ | මිල්ලන්ගොඩ බෝ ගහ අසල |
| මාලිගාතැන්න | මාලිගාතැන්න විද්‍යාලය අසල |
| කන්දේවත්ත | කන්දේවත්ත බුලුගහමුල අසල |

අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

07-435

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.